**රඹෑව ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 10 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 11 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** ලෙජරයේ ගිණුම් නිසි පරිදි පවත්වා නොතිබුණි.

**(ආ)** ලැබිය යුතු ආදායම් එකතුව රු.1,451,538 ක් උපචිත පදනමට අනුගතවන පරිදි ගිණුම්ගත කර නොතිබුණි.

**(ඇ)** ශේෂ පිරික්සුමේ සඳහන් ගිණුම් ශේෂ 04ක එකතුව රු.152,765 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

**(ඈ)** වටිනාකම රු.5,100,000 ක් වූ කාර්යාල ගොඩනැගිල්ල රු.75,342 ක් වූ කාර්යාල ලේඛනාගාරය හා රු.1,800,000 ක් වූ නව ආපන ශාලා ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.

**(ඉ)** ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් කර ඇති ඉඩම් 02 ක් හා ගොඩනැගිලි 07 ක්, ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වලින් අත්හැරී තිබුණි.

**(ඊ)** වත්කම් උපලේඛනයේ දක්වා ඇති එකතුව රු.1,159,190 ක් වූ මෝටර් වාහන 04 ක් සමාලෝචිත වසරේ ඉදිරියට ගෙනා මෝටර් රථ හා කරත්ත තුළ හෝ වර්ෂයේ මිළදී ගැනීම් තුළින් අත්හැරී තිබුණි.

**1.3.2 නොසැසඳු ගිණුම්**

--------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම් හා වගකීම් ගිණුම් 08 ක ශේෂයන් හා ඒ සඳහා ඉදිරිපත් කල උපයෝගී පොත් වල දැක්වෙන ශේෂයන් අතර රු.14,874,710 ක වෙනසක් පැවතුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.736,552 ක්වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය රු.1,496,155 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.1 දුරකථන කුළුණු ගාස්තු**

-------------------------

ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/08 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව දුරකථන/විදුලි සංදේශ කුළුණු සඳහා උස පදනම් කරගෙන ගාස්තු අයකළ යුතු වුවත් සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 09 ක් සම්බන්ධයෙන් එපරිදි ක්‍රියාකර නොතිබුණි.

**2.2.2 මුද්දර ගාස්තු**

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2)(ආ) වගන්තියේ විධිවිධාන අනුව මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන ප්‍රාදේශීය සභා අරමුදලට බැර කිරීමට කටයුතු කළයුතු වුවත් 2011,2012 හා 2013 වර්ෂවලට අදාලව කිසිදු හිඟ මුද්දර ගාස්තු ආදායමක් සභාවට ලැබී නොතිබුණි.

**2.2.3 බදුකුලී**

**---------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව සභාවට අයවිය යුතු රු.87,542 ක බදුකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ශේෂ 2012 වර්ෂයේ සිට ඉදිරියට එමින් පැවතින.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

**3.1 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

**--------------------------------**

**(අ)** 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන ශ්‍රී ලංකා ජනරජයේ (අති විශේෂ) ගැසට් නිවේදනයට අනුව සභාපතිවරයාගේ නිල වාහනය සඳහා මාසික අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර් 400 ක් වුවත් එම අනුමත සීමාව ඉක්මවා රු. 16,560 ක ඉන්ධන ලබාදී තිබුණි.

**(ආ)** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**(ඇ)** වසර 10කට වඩා පැරණි අයනොවන සේවක ණය රු.240,118 ක මුදලක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**04 පද්ධති හා පාලනය**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලනය ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය.

**(ඇ)** **වත්කම් කළමනාකරණය.**